# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

09 ශ්‍රේණිය | ඉතිහාසය | ඒකකය 01 - ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසීන් යටතට පත්වීම.

## I කොටස

❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

- **අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ලන්දේසීන්ගේ මව් රට වූයේ,

 (1). බ්‍රිතාන්‍ය (2). පෘතුගාලය (3). ඕලන්දය (4). ඉන්දියාව

02. ඕලන්ද පාලකයා විසින් ''ලන්දේසි පෙරදිග ඕලන්ද වෙළඳ සමාගම'' (VOC) පිහිටුවන ලද්දේ,

 (1). 1802 (2). 1602 (3). 1702 (4). 1638

03. මෙම ''VOC'' සමාගමේ රාජකීය බලපත්‍රය අනුව ඔවුන්ට ලැබුණු බලයක් නොවන්නේ,

 (1). යුරෝපීය රටවල වෙළඳාම් කිරීම
 (2). ආසියානු ප්‍රදේශ යටත් කිරීමට
 (3). බලකොටු ඉදිකිරීමට
 (4). ආණ්ඩුකාරවරුන් පත් කිරීමට හා අදාළ ප්‍රදේශ පාලනය කිරීමට

04. ආසියාවේ ලන්දේසි පාලන මූලස්ථානය පිහිටුවා ගන්නා ලද්දේ,

 (1). ශ්‍රී ලංකාවේය (3). ජාවා දූපතේ බතාවියේය
 (2). ගෝව ප්‍රදේශයේය (4). කල්කටාවේය

05. පළමුවන විමලධර්මසූරිය රජු හමුවීමට පැමිණි ලන්දේසි ජාතික අද්මිරාල්වරයා වූයේ,

 (1). ජෙනරල් ජෙරාඩ් හල්ෆ්ට් (3). කොරනේලිස් ටැකල්
 (2). ජොරිස් වැන් ස්පිල් බර්ජන් (4). සිබෙල් ද වර්ට්

06. දෙවන රාජසිංහ රජු හා ලන්දේසීන් අතර ඇති වූ ගිවිසුම අත්සන් කරන ලද්දේ,

 (1). 1638 වර්ෂයේ මැයි මාසයේය (3). 1602 වර්ෂයේ මැයි මාසයේය
 (2). 1638 වර්ෂයේ ජූනි මාසයේය (4). 1658 වර්ෂයේ මැයි මාසයේය

07. දිවයිනේ මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි පාලනයක් ඇති වූ කාලවකවානුව වූයේ,

 (1). 1796 සිට 1815 දක්වා (3). 1658 සිට 1796 දක්වා
 (2). 1602 සිට 1796 දක්වා (4). 1558 සිට 1815 දක්වා

08. ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල එතෙක් පැවති පෘතුගීසි පාලනය අවසන් වූයේ,

 (1). 1602 වර්ෂයේ යාපනය හා කල්පිටිය අල්ලා ගැනීම
 (2). 1658 වර්ෂයේ ගාලු කොටුව අල්ලා ගැනීම සමඟය
 (3). 1658 වර්ෂයේ මන්නාරම ද පසුව යාපනය හා කල්පිටිය ලන්දේසීන් අල්ලා ගැනීමත් සමඟය
 (4). 1658 වර්ෂයේ ත්‍රිකුණාමලය හා කොළඹ වරාය අල්ලා ගැනීමෙනි

EXAMRESULTS.LK

09. පළමුවන විමලධර්මසූරිය රජුගේ ආරම්භ වූ උඩරට රාජ පරම්පරාව නිමාවට පත් වූයේ,

(1). 1739 දී දෙවන විමලධර්මසූරිය රජු මිය යාමෙනි

(2). සෙනරත් රජු බලයට පත් වීමෙනි

(3). දෙවන රාජසිංහ රජු 1656 මිය යාමෙනි

(4). 1739 දී ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ මිය යාමෙනි

10. වැලිවිට සරණංකර හිමියන්ගේ උපදෙස් පරිදි ලන්දේසීන් ගෙන් නැව් ලබාගෙන උපසම්පදාව ගෙන ඒම සඳහා සියමයට දූතයින් යවන ලද්දේ,

(1). ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

(2). ශ්‍රී විජය රාජසිංහ රජු

(3). දෙවන රාජසිංහ රජු

(4). කීර්ති ශ්‍රී රාජසිංහ රජු

- **පහත දැක්වෙන වගන්ති හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

11. ලන්දේසි ජාතිකයෝ රෙපරමාදු භක්තිකයෝය. (    )

12. විමලධර්මසූරිය රජුගෙන් පසු රජුගේ සහෝදරයෙකු වූ සෙනරත් රජු බලයට පත් විය. (    )

13. ලංකාවේ සියම් නිකායේ ආරම්භය 1753 වර්ෂයේ උපසම්පදාව පිහිටුවීමත් සමඟය. (    )

14. ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන රෝම-ලන්දේසි නීතිය ඉංග්‍රීසින්ගෙන් ලද දායාදයකි. (    )

15. පාසල් තෝම්බු, ඉඩම් තෝම්බු, පවුල් තෝම්බු යනු පෘතුගීසින් විසින් කළ ලේඛන විශේෂයකි. (    )

- **හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16. ලන්දේසීන් යටතේ සිවිල් පාලන කටයුතුවලදී වැදගත් බලයක් හිමිව තිබුණේ ..........................................
(දිසාවේවරයාට / කෝරාලටය)

17. ලන්දේසීන් විසින් මුද්‍රණ යන්ත්‍රයක් මුලින්ම මෙරටට ගෙන එන ලද්දේ ................................... (1639 / 1739) දීය.

18. කීර්ති ශ්‍රී රාජසිංහ හමුවීමට පැමිණි මුල්ම ඉංග්‍රීසි දූතයා වූයේ ..........................................................................
(හියු බොයිඩ් / ජෝන් පයිබස්)

19. ලන්දේසි පාලන සමයේ දී අපරාධ නඩු විසඳීම සඳහා හඳුන්වා දී තිබුණේ ..........................................................
(රාද් වැන් ජස්ටිට් / සිවිල් රාද්) නම් උපාධියයි.

20. ඉස්තෝප්පුව, සොල්දරය, කුලුණු හා උස් වහල යෙදූ නිවාස ඉදි වූයේ ................................ (පෘතුගීසි / ලන්දේසි) පාලන සමයේදීය.

## II කොටස

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. පහත පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B

(1). A රූපයෙන් දැක්වෙන පුද්ගලයින් දෙදෙනා නම් කරන්න. (ල.06)

(2). ඔවුන් හමු වූයේ කුමන වර්ෂයේද? (ල.03)

(3). B රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද? (ල.03)

(4). එය යටත් කර ගැනීමට හැකි වූයේ කුමන වර්ෂයේද? (ල.03)

(5). එතුමා මෙරට විධායක ජනාධිපති වූයේ කිනම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යටතේද?

02. (1). සෙනරත් රජුගෙන් පසු බලයට පත් වූ රජු කවුරුන්ද? (ල.02)

(2). පෘතුගීසින් මෙරටින් පලවා හැරීම සඳහා එම රජු ගත් ක්‍රියාමාර්ග මොනවාද? (ල.05)

(3). එම රජු විසින් ලන්දේසින් සමඟ ඇති කරගත් ගිවිසුමේ කරුණු 3ක් දක්වන්න. (ල.06)

(4). රජු හා ලන්දේසින් අතර මතභේද ඇති වීමට හේතු 2 නම් කරන්න. (ල.02)

03. (1). 1687 දෙවන රාජසිංහ රජු මිය ගිය පසු බලයට පත් වූයේ කවුරුන්ද? (ල.02)

(2). එම රජු හා ලන්දේසින් අනුගමනය කළ ක්‍රියාමාර්ග 3 නම් කරන්න. (ල.06)

(3). දෙවන රාජසිංහ රජුගෙන් පසු ''කුණ්ඩසාලේ කුමාරයා'' නමින් ප්‍රකට වූ රජු කවුද? (ල.02)

(4). මෙම රජු හා ලන්දේසින් අතර පැවති සාමකාමී සම්බන්ධතා පලුදු වීමට බලපෑ හේතු මොනවාද? (ල.05)

04. (1). 1766 ගිවිසුමට සම්බන්ධ දෙපාර්ශවය නම් කරන්න. (ල.03)

(2). 1766 ගිවිසුමේ වගන්ති 2ක් ලියන්න. (ල.04)

(3). ලන්දේසින් යටතේ මෙරට බෙදා තිබූ ප්‍රදේශ ප්‍රධාන කොටස් නම් කරන්න. (ල.03)

(4). ලන්දේසින්ගේ සිවිල් පාලනයේදී දේශීය නිලධාරීන්ට ඉඩකඩ විවර වූ පහළ තනතුරු 4 ක් නම් කරන්න. (ල.04)

05. (1). ලන්දේසි පාලන සමයේදී මෙරට පැවති නීති පද්ධතිය කවර ආකාර වීද? (ල.03)

(2). ලන්දේසීන් හඳුන්වාදුන් නව උසාවි පද්ධතිය ලියා දක්වන්න. (ල.04)

(3). ලන්දේසි පාලන සමයේ මෙරට අධ්‍යාපන පද්ධතිය සකස් වී තිබූ ආකාරය කෙටියෙන් දක්වන්න. (ල.04)

(4). ලන්දේසි පාලනය නිසා ලාංකේය සමාජයට හා සංස්කෘතියට සිදු වූ බලපෑම් විස්තර කරන්න. (ල.04)

*සැකසුම: පමෝදා හේවාවිතාරණ මිය*